ශ්‍රී ලංකා

## ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

## පාර්ලිමේන්තුව

---

# 1981 අංක 59 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත

---

[සහතිකය සටහන් කළේ 1981 සැප්තැම්බර් මස 16 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 සැප්තැම්බර් මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිල : රු. 1.55 යි | තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1931 අංක 59 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත

[සහතිකය සටහන් කළේ 1081 සැප්තැම්බර් මස 16 වැනි දින]

එල්. ඩී.—ඕ. 76/70.

**ශ්‍රී ලංකා ජල තීරයේ දූෂණය වැළැක්වීම, අඩු කිරීම සහ පාලනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද සමුද්‍රයේ දූෂණය වැළැක්වීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති බලගැන්වීම පිණිස ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

**1.** මේ පනත 1981 අංක 59 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයේ දී එය ක්‍රියාත්මක වන්නේ ය.

## I වන කොටස

### සමුද්‍ර දූෂණය වැළැක්වීමේ අධිකාරිය පිහිටුවීම

සමුද්‍ර දූෂණය වැළැක්වීමේ අධිකාරිය පිහිටුවීම.

**2.** (1) (මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) සමුද්‍ර දූෂණය වැළැක්වීමේ අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ ද (3) වන උපවගන්තිය යටතේ එම අධිකාරියේ තත් කාලයෙහි සාමාජිකයන් වන්නා වූ තැනැත්තන්ගෙන් සමන්විත වන්නා වූ ද අධිකාරියක් පිහිටුවනු ලැබේ.

(2) අමාත්‍යවරයාගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව, මේ පනතේ විධිවිධාන පරිපාලනය කිරීම සඳහා අධිකාරිය වගකිව යුතු ය.

(3) අධිකාරිය අමාත්‍යවරයා විසින් පත් කරන ලද පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) නාවුක කටයුතු, වරාය මෙහෙයුම් හා සමුද්‍ර දූෂණය වැළැක්වීම සම්බන්ධයෙන් පුළුල් පළපුරුද්දක් ඇති සහ හැකියාවක් දක්වා ඇති බවට අමාත්‍යවරයාට පෙනී යන සාමාජිකයන් තිදෙනෙක් ;

(ආ) විදේශ කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරන ලද එක් සාමාජිකයෙක් ; සහ

(ඇ) ධීවර විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරන ලද එක් සාමාජිකයෙක්.

(4) (3) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයන්ගෙන් එක් සාමාජිකයකු අධිකාරියේ සභාපතිවරයා ලෙස අමාත්‍යවරයා විසින් පත් කළ යුතු ය.

(5) සභාපතිවරයා සහ (3) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයන් (7) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය. එහෙත් නැවත පත් කරනු ලැබීමට ඔවුන් සුදුසු විය යුතු ය.

(6) අධිකාරියේ සභාපතිවරයා හෝ (3) වන උපවගන්තිය යටතේ පත් කරන ලද යම් සාමාජිකයකු හෝ කිසිම හේතුවක් නොදක්වා, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය:

එසේ වුවද (3) වන උපවගන්තියේ (ආ) හෝ (ඇ) ඡේදය යටතේ පත් කරන ලද කිසිම සාමාජිකයකු ඔහු නාම කරනු ලැබුවේ යම් අමාත්‍යවරයකු විසින් ද ඒ අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව මේ වගන්තිය යටතේ ධුරයෙන් ඉවත් නොකළ යුතු ය.

(7) අධිකාරියේ සභාපතිවරයා විසින් හෝ (3) වන උපවගන්තිය යටතේ පත් කරන ලද යම් සාමාජිකයකු විසින් හෝ ධුරය හිස් කරනු ලැබුවහොත් නැතහොත් ඉහතින් වූ උපවගන්තියේ විධිවිධාන යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත්, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කොටස තුළ ඒ ධුරය දැරීමට වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කළ හැකි ය:

එසේ වුවද ඒ ධුරය හිස් කරනු ලැබුවේ හෝ ඒ ධුරයෙන් ඉවත් කිරීමට භාජන වූයේ (3) වන උපවගන්තියේ (ආ) හෝ (ඇ) ඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයකු නම්, ඒ සාමාජිකයා නම් කරනු ලැබුවේ යම් අමාත්‍යවරයකු විසින් ද ඒ අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව මේ උපවගන්තිය යටතේ කිසිම පත්වීමක් කරනු නො ලැබිය යුතු ය.

(8) අධිකාරියේ සභාපතිවරයා හෝ (3) වන උපවගන්තිය යටතේ පත් කරන ලද යම් සාමාජිකයකු හෝ රෝගාතුරවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ තම ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වන්නේ නම්, අවස්ථාවෝචිත පරිදි, සභාපතිවරයා හෝ සාමාජිකයා වශයෙන් කටයුතු කිරීමට අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කළ හැකි ය:

එසේ වුව ද තම ධුරයේ කාර්ය ඉටු කිරීමට එසේ අපොහොසත් වන සාමාජිකයා (3) වන උපවගන්තියේ (ආ) හෝ (ඇ) ඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයකු නම්, ඒ සාමාජිකයා නම් කරනු ලැබුවේ යම් අමාත්‍යවරයකු විසින් ද ඒ අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව මේ උපවගන්තිය යටතේ කිසිම පත්වීමක් කරනු නො ලැබිය යුතු ය.

(9) සභාපතිවරයා විසින් හෝ යම් සාමාජිකයකු විසින් හෝ තත්කාර්යය සඳහා අමාත්‍යවරයා වෙත යවන ලද ලිපියක් මගින්, අවස්ථාවෝචිත පරිදි, සභාපතිවරයා හෝ සාමාජිකයා වශයෙන් වූ තම ධුරයෙන් කලින් ඉල්ලා අස් විය හැකි ය.

(10) යම් තැනැත්තෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් නම් නැත හොත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වන්නේ නම් ඒ තැනැත්තා අධිකාරියේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ නම් කරනු ලැබීමට හෝ එහි සාමාජිකයකු ලෙස නොකඩව ධුරය දැරීමට හෝ නුසුදුසු වන්නේ ය.

(11) අධිකාරියේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් හෝ එහි සාමාජිකයකුගේ පත්වීම සම්බන්ධයෙන් යම් දෝෂයක් තිබීමේ හේතුව නිසා ම පමණක් අධිකාරියේ ක්‍රියාවක් හෝ කටයුත්තක් බලරහිත ලෙස සලකනු නොලැබිය යුතු ය.

(12) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ආකාරයට සහ අනුප්‍රමාණ අනුව අධිකාරියේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි අතර එලෙසම නිශ්චය කරනු ලබන සේවා කොන්දේසිවලට ඔවුන් යටත් විය යුතු ය.

(13) අධිකාරියේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් නිදෙනකු විය යුතු අතර ඒ අධිකාරියේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල දී කටයුතු කිරීම සම්බන්ධයෙන් වූ කාර්ය පටිපාටිය අධිකාරිය විසින් විධිමත් කරනු ලැබිය හැකි ය.

## II වන කොටස

### දූෂණය වැළැක්වීම—අපරාධ වගකීම

3. යම් නැවකින් හෝ (ගොඩබිම ස්ථානයකට හෝ ගොඩබිම ස්ථානයකින් හෝ වෙනත් නැවකින් හෝ) නැවකින් හෝ නැවකට තෙල් හෝ වෙනත් දූෂක ද්‍රව්‍යයක් මාරු කිරීම සඳහා පාවිච්චි කරනු ලබන යම් උපකරණයකින්, හෝ අක්වෙරළේ ඉදිකිරීමකින් හෝ නල මාර්ගයකින්, හෝ ගොඩබිම ස්ථානයකින්, හෝ මුහුදු පත්ල හෝ යටිපස ගවේෂණය කිරීම සඳහා හෝ එහි ස්වාභාවික සම්පත් ගවේෂණය කිරීම සඳහා වූ යම් මෙහෙයුමක ප්‍රතිඵලය වශයෙන් හෝ ශ්‍රී ලංකා ජලතීරයට තෙල් හෝ වෙනත් දූෂක ද්‍රව්‍යයක් පිටකරනු ලැබුව හොත් නැතහොත් පිටවුවහොත්, එවිට මේ පනතේ විධිවිධානවලට යටත්ව— තෙල් හෝ වෙනත් දූෂක ද්‍රව්‍යයක් ශ්‍රී ලංකා ජලතීරයට පිට කිරීම හෝ පිටවීම.

(අ) එම පිටකිරීම හෝ පිටවීම නැවකින් නම් ඒ නැවේ අයිතිකරු, ක්‍රියාකරවන්නා, නෞකාධිපතිවරයා හෝ අනුයෝජිතයා ; හෝ

(ආ) නැවකට හෝ නැවකින් තෙල් හෝ දූෂක ද්‍රව්‍යයක් මාරු කරන අතරතුර දී පිටකිරීම හෝ පිටවීම සිදු වුවහොත්, ඒ නැවේ අයිතිකරු හෝ නෞකාධිපතිවරයා නැතහොත් තෙල් හෝ දූෂක ද්‍රව්‍යයක් මාරු කිරීම සඳහා පාවිච්චි කරනු ලබන යම් උපකරණයකින් පිටකිරීම හෝ පිටවීම සිදුවන අවස්ථාවක, ඒ උපකරණයේ අයිතිකරු හෝ එය භාරව සිටින තැනැත්තා ; හෝ

(ඇ) පිටකිරීම හෝ පිටවීම අක්වෙරළේ ඉදිකිරීමකින් වන්නේ නම්, නැතහොත් මුහුදු පත්ල හෝ එහි යටිපස ගවේෂණය කිරීම සඳහා වූ හෝ එහි ස්වභාවික සම්පත් ගවේෂණය කිරීම සඳහා වූ යම් මෙහෙයුම්වල ප්‍රතිඵලයක් වශයෙන් වන්නේ නම්, එම ඉදිකිරීමේ අයිතිකරු හෝ එහි පදිංචිකරු හෝ මෙහෙයුම කරගෙන යන තැනැත්තා හෝ මෙහෙයුම භාරව සිටින තැනැත්තා ; හෝ

(ඇ) පිටකිරීම හෝ පිටවීම නල මාර්ගයකින් වන්නේ නම්, ඒ නල මාර්ගයේ අයිතිකරු හෝ ක්‍රියා කරවන්නා ; හෝ

(ඉ) පිටකිරීම හෝ පිටවීම ගොඩබිම ස්ථානයකින් වන්නේ නම්, එම ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු හෝ පිටකිරීම හෝ පිටවීම අයිතිකරුගේ හෝ පදිංචිකරුගේ හෝ (ප්‍රකාශිත හෝ ගම්‍යමාන) අවසරය නොමැතිව එම ස්ථානයෙහි සිටින වෙනත් තැනැත්තකුගේ ක්‍රියාවකින් සිදුකරනු ලබන්නේ නම් ඒ තැනැත්තා හෝ

වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් දසලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

ශ්‍රී ලංකා ජලතීරයට තෙල් හෝ වෙනත් දූෂක ද්‍රව්‍යයක් දමීම.

4. අධිකාරියෙන් ලබාගත් අවසර පත්‍රයක නියමයන්ට සහ කොන්දේසිවලට අනුකූලව මිස, ශ්‍රී ලංකා ජලතීරයට තෙල් හෝ වෙනත් දූෂක ද්‍රව්‍යයක් දමන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් දසලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

විශේෂ විත්තිවාචක.

5. (1) 3 වන වගන්තිය හෝ 4 වන වගන්තිය යටතේ චෝදනා කරනු ලැබූ තැනැත්තකු නැවක අයිතිකරු, ක්‍රියාකරවන්නා, නෞකාධිපතිවරයා හෝ අනුයෝජිතයා වන්නා වූ හෝ අක්වෙරළේ ඉදිකිරීමක අයිතිකරු හෝ එහි පදිංචිකරු වන්නා වූ අවස්ථාවක, ප්‍රස්තුත තෙල් හෝ වෙනත් දූෂක ද්‍රව්‍යය පිටකරනු ලැබුවේ නැතහොත් දමනු ලැබුවේ යම් නැවක හෝ අක්වෙරළේ යම් ඉදිකිරීමක ආරක්ෂාව තහවුරු කිරීම සඳහා හෝ ඒ නැවට හෝ අක්වෙරළේ ඉදිකිරීමට හෝ නැව්බඩුවලට යම් හානියක් වීම වැළැක්වීම සඳහා හෝ මුහුදේ දී මනුෂ්‍ය ජීවිත ආරක්ෂා කර ගැනීම සඳහා බව සහ ඒ පිටකිරීමෙන් හෝ දැමීමෙන් සිදුවන හානිය හැකි පමණ අඩු කිරීමට සාධාරණ සැලකිල්ලක් දක්වා ඇති බව ඔප්පු කිරීම විත්තිවාචකයක් විය යුතු ය.

(2) 3 වන වගන්තිය යටතේ වරදක් සම්බන්ධයෙන් චෝදනා කරනු ලැබූ තැනැත්තකු නැවක අයිතිකරු, ක්‍රියා කරවන්නා, නෞකාධිපතිවරයා හෝ අනුයෝජිතයා වන අවස්ථාවක—

(අ) තෙල් හෝ වෙනත් දූෂක ද්‍රව්‍යය පිටවූයේ නැවට වූ හානියක ප්‍රතිඵලය වශයෙන් බව සහ පිටවීම සොයා ගැනීමෙන් පසුව පිටවීම වැළැක්වීමේ සහ හැකි පමණ අඩු කිරීමේ කාර්ය සඳහා සියලු සාධාරණ ආරක්ෂා මාර්ග ගනු ලැබූ බව ;

(ආ) තෙල් හෝ වෙනත් දූෂක ද්‍රව්‍යය කාන්දුවීමේ හේතුවෙන් පිට වූ බව මෙන්ම එසේ වූයේ සාධාරණ සැලකිල්ලක් නොමැති වීම නිසා නොවන බව සහ පිටවීම සොයා ගනු ලැබීමෙන් පසුව හැකි ඉක්මණින් පිටවීම වැළැක්වීමේ හෝ හැකි පමණ අඩු කිරීමේ කාර්ය සඳහා සියලු සාධාරණ පියවර ගනු ලැබූ බව

ඔප්පු කිරීම විත්තිවාචකයක් විය යුතු ය.

(3) (අ) 3 වන වගන්තිය යටතේ වරදක් සම්බන්ධයෙන් චෝදනා කරනු ලැබූ තැනැත්තකු යම් උපකරණයක අයිතිකරු හෝ එය භාරව සිටින තැනැත්තා වන අවස්ථාවක, හෝ තෙල් හෝ වෙනත් දූෂක ද්‍රව්‍යය පිටවූයේ යයි කියනු ලබන, අවස්ථාවෝචිත පරිදි, අක්වෙරළේ ඉදිකිරීමක, නල මාර්ගයක හෝ ගොඩබිම ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු වන අවස්ථාවක තෙල් හෝ වෙනත් දූෂක ද්‍රව්‍යය පිටවීම යම් සාධාරණ සැලකිල්ලක් නොමැතිවීම නිසා නොවන බව, සහ පිටවීම සොයා ගැනීමෙන් පසු හැකි ඉක්මණින් එය නැවැත්වීම හෝ අඩුකිරීම සඳහා සියලු සාධාරණ පියවර ගනු ලැබූ බව ඔප්පු කිරීම විත්තිවාචකයක් විය යුතු ය ;

(ආ) අක්වෙරළේ ඉදිකිරීමක, නල මාර්ගයක හෝ ගොඩබිම ස්ථානයක අයිතිකරුගේ හෝ පදිංචිකරුගේ (ප්‍රකාශිත හෝ ගම්‍යමාන) අවසරය නොමැතිව එම ස්ථානයෙහි සිටි තැනැත්තකුගේ ක්‍රියාවකින් පිට කිරීම සිදු වූ බව එම අයිතිකරු හෝ පදිංචිකරු විසින් ඔප්පු කිරීම විත්තිවාචකයක් විය යුතු ය.

(4) (අ) යම් ලිඛිත නීතියකින් පවරන ලද යම් බලයක් ක්‍රියාත්මක කිරීමේ දී හෝ අමාත්‍යවරයාගේ ලිඛිත උපදෙස් යටතේ ක්‍රියා කිරීමේ දී, ගිලුනු, වෙරළේ වැදුනු හෝ අත්හරින ලද යාත්‍රා අධිකාරිය විසින් ඉවත් කිරීමේ ප්‍රතිඵලය වශයෙන් තෙල් හෝ වෙනත් දූෂක ද්‍රව්‍යයක් පිටකරනු ලබන හෝ දමනු ලබන අවස්ථාවක ;

(ආ) දූෂණයෙන් වන හානි හැකි පමණ අඩු කිරීම පිණිස දූෂණය පිළිබඳ නිශ්චිත සිද්ධීන් මර්දනය කිරීමේ කාර්යය සඳහා අධිකාරිය විසින් තෙල් හෝ වෙනත් දූෂක ද්‍රව්‍ය ඇතුළත් ද්‍රව්‍ය පිටකරනු ලබන හෝ දමනු ලබන අවස්ථාවක

3 වන වගන්තිය හෝ 4 වන වගන්තිය යටතේ කිසිම වගකීමක් උද්ගත නොවිය යුතු ය.

## III වන කොටස

### දූෂණය වැළැක්වීම—සිවිල් වගකීම

6. (1) 3 වන වගන්තියෙහි හෝ 4 වන වගන්තියෙහි සඳහන් යම් ක්‍රියාවක ප්‍රතිඵලය වශයෙන් ශ්‍රී ලංකා ජලතීරය හෝ පෙරවෙරළ දූෂණය වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, නැවේ අයිතිකරු හෝ ක්‍රියා කරවන්නා හෝ උපකරණයේ අයිතිකරු හෝ එය භාරව සිටින තැනැත්තා හෝ අක්වෙරළේ ඉදිකිරීමේ අයිතිකරු හෝ එහි පදිංචිකරු හෝ නල මාර්ගයේ අයිතිකරු— සිවිල් වගකීම.

(අ) තෙල් හෝ වෙනත් දූෂක ද්‍රව්‍යයක් පිටකිරීමෙන්, පිටවීමෙන් හෝ දැමීමෙන් ශ්‍රී ලංකා ජලතීරයට හෝ එහි පෙරවෙරළට හෝ එය ආශ්‍රිත යම් සම්බන්ධතාවකට සිදුවුණු යම් හානියක් ;

(ආ) යම් තෙල් හෝ වෙනත් දූෂක ද්‍රව්‍යයක් පිටකිරීමෙන්, පිට වීමෙන් හෝ දැමීමෙන් ශ්‍රී ලංකා ජලතීරයට හෝ පෙර වෙරළට හෝ එය ආශ්‍රිත යම් සම්බන්ධතාවකට හෝ සිදුවුණු යම් හානියක් වැළැක්වීමේ, අඩුකිරීමේ හෝ ඉවත් කිරීමේ කාර්යය සඳහා ගන්නා ලද යම් ක්‍රියා මාර්ගවල වියදම්

සම්බන්ධයෙන් වගකීමට යටත් විය යුතු ය.

(2) මේ වගන්තියෙහි ශ්‍රී ලංකා ජලතීරය හෝ පෙරවෙරළ ආශ්‍රිත සම්බන්ධතා යන්නට—

(අ) ධීවර කටයුතු ඇතුළුව සාමුද්‍රික, වෙරළබඩ, වරාය හෝ ගංමෝදර කටයුතු ;

(ආ) සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ වැල්ල සහ කොරල් ගල්පර ඇතුළුව ශ්‍රී ලංකා ජලතීරයේ හෝ පෙරවෙරළේ සංචාරකයන්ගේ සිත් ගන්නා තැන් ආරක්ෂා කිරීම සහ සංවර්ධනය කිරීම ;

(ඇ) වෙරළබඩ ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍යය සහ යහපත ;

(ඈ) සජීවී මුහුදු සම්පත් සහ වනසතුන් ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම

ඇතුළත් වේ.

(3) නැව් දෙකකින් හෝ වැඩි ගණනකින් යම් තෙල් හෝ වෙනත් දූෂක ද්‍රව්‍යයක් පිටකරනු ලැබ, හෝ පිටවී හෝ දමනු ලැබ එක් එක් නැවේ අයිතිකරු හෝ ක්‍රියා කරවන්නා මේ වගන්තිය යටතේ වගකීමට යටත් වන්නා වූ ද එක් එක් අයිතිකරු හෝ ක්‍රියා කරවන්නා වගකිවයුතු හානිය සෝ වියදම් අනෙක් තැනැත්තා හෝ තැනැත්තන් වගකිවයුතු හානියෙන් හෝ වියදම්වලින් සාධාරණ ලෙස වෙන් කරනු ලැබිය නොහැකි වන්නා වූ ද අවස්ථාවක, මේ වගන්තිය යටතේ අයිතිකරු හෝ ක්‍රියා කරවන්නා වගකීමට යටත් වන සම්පූර්ණ හානිය හෝ වියදම් සම්බන්ධයෙන් එක් එක් අයිතිකරු හෝ ක්‍රියා කරවන්නා අනෙක් තැනැත්තා හෝ තැනැත්තන් සමග එක්ව හා වෙන් වෙන්ව වගකීමට යටත් විය යුතු ය.

විශේෂ විත්තිවාචක.

7. 6 වන වගන්තිය යටතේ යම් තැනැත්තකුට විරුද්ධව නඩුවක් පවරනු ලැබූ අවස්ථාවක, යුද්ධ ක්‍රියාවක්, යුද ගැටුම්, සිවිල් යුද්ධ, රාජ්‍ය විරෝධී කැරලි හෝ අසාමාන්‍ය, නොවැළැක්විය හැකි හා මැඩලිය නොහැකි ආකාරයේ ස්වාභාවික සිද්ධියක් හේතුකොට ගෙන එම පිටකිරීම, පිටවීම හෝ දැමීම සිදු වූ බව ඔප්පු කිරීම විත්තිවාචකයක් විය යුතු ය.

වගකීමේ සීමාව.

8. (1) (අ) 6 වන වගන්තිය යටතේ යම් එක් සිද්ධියක් සම්බන්ධයෙන් වගකීම නැවේ ටොන් ධාරිතාවෙන් එක් එක් මෙට්‍රික් ටොන් එක සඳහා රුපියල් හත් දහස් දෙසිය දහයක මුළු මුදලකට (හෝ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මුදල් ලබා ගැනීමේ විශේෂ අයිතිවාසිකම් දෙපාර්තමේන්තුවෙහි දරනු ලබන ඒ සමාන මුදල් ලබා ගැනීමේ විශේෂ අයිතිවාසිකම් ප්‍රමාණයකට) සීමා විය යුතු ය.

(ආ) මේ පනතේ මේ කොටස යටතේ, අවස්ථාවෝචිත පරිදි නැවක අයිතිකරු හෝ ක්‍රියා කරවන්නා විසින් හෝ උපකරණයක අයිතිකරු හෝ එය භාරව සිටින තැනැත්තා විසින් හෝ අක්වෙරළේ ඉදිකිරීමක, නල මාර්ගයක හෝ ගොඩබිම ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු විසින් හෝ දරනු ලබන උපරිම වගකීම රුපියල් හත්තැපත් කෝටියකට (හෝ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මුදල් ලබා ගැනීමේ විශේෂ අයිතිවාසිකම් දෙපාර්තමේන්තුවෙහි දරනු ලබන ඒ සමාන මුදල් ලබා ගැනීමේ විශේෂ අයිතිවාසිකම් ප්‍රමාණයකට) සීමා විය යුතු ය.

(2) 6 වන වගන්තියෙහි සඳහන් යම් ක්‍රියාවක් සිදුවූයේ අවස්ථාවෝචිත පරිදි, නැවක අයිතිකරුගේ හෝ ක්‍රියාකරවන්නාගේ හෝ උපකරණයක අයිතිකරුගේ හෝ එය භාරව සිටින තැනැත්තාගේ හෝ අක්වෙරළේ ඉදිකිරීමක, නල මාර්ගයක හෝ ගොඩබිම ස්ථානයක අයිතිකරුගේ හෝ පදිංචිකරුගේ නොසලකා හැරීමේ ප්‍රතිඵලය වශයෙන් නම් මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි විධිවිධාන සලසා ඇති සීමාකිරීම්වලින් ප්‍රයෝජන ගැනීමට ඒ තැනැත්තාට හිමිකම නැත්තේ ය.

(3) මේ වගන්තියෙහි "නැවේ ටොන් ධාරිතාව" නැවේ දළ ටොන් ධාරිතාව විය යුතු ය.

9. (1) තොග වශයෙන් වූ තෙල් මෙට්‍රික් ටොන් දෙදහසකට වැඩි ප්‍රමාණයක් නැව්බඩු වශයෙන් රැගෙන, ශ්‍රී ලංකාවේ වරායකට ඇතුළු වන්නා වූ හෝ ඉන් පිට වන්නා වූ හෝ ශ්‍රී ලංකා ජලතීරයට හෝ ශ්‍රී ලංකා ජලතීරයේ පර්යන්තයකට ඇතුළු වන්නා වූ හෝ ඉන් පිටවන්නා වූ නැවක අයිතිකරු හෝ ක්‍රියා කරවන්නා විසින් ඒ නැව සම්බන්ධයෙන් වලංගු රක්ෂණ සහතිකයක් හෝ බැංකුවක ඇපකරයක් හෝ අධිකාරියට පිළිගත හැකි ජාත්‍යන්තර අරමුදලකින් භාර දෙන ලද සහතිකයක් හෝ 1969 තෙල් දූෂණ හානි සම්බන්ධයෙන් සිවිල් වගකීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියට පාර්ශ්වකරුවකු වන්නා වූ රාජ්‍යයක ඒ නැව ලියාපදිංචි කරනු ලැබ ඇත්නම්, ඒ රාජ්‍යයේ උචිත බලධරයා විසින් නිකුත් කරන ලද සහතිකයක් වැනි වෙනත් මූල්‍ය ඇපකරයක් හෝ තබාගත යුතු ය. අනිවාර්ය රක්ෂණය.

(2) නැවක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තියෙන් නියමිත රක්ෂණ සහතිකය හෝ වෙනත් ඇපකරය නැවෙහි ගෙන යනු ලැබිය යුතු අතර ඉල්ලූ විට නෞකාධිපතිවරයා විසින් අධිකාරිය වෙත හෝ අධිකාරිය විසින් තත් කාර්යය සඳහා බලය දෙන ලද යම් තැනැත්තකු වෙත හෝ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය කඩ කරමින් නැවක් ශ්‍රී ලංකාවේ වරායකට ඇතුළුවන හෝ ඉන් පිටවන හෝ ශ්‍රී ලංකාවේ වරායකට ඇතුළු වීමට හෝ ඉන් පිටවීමට තැත් කරන හෝ ශ්‍රී ලංකා ජල තීරයට පැමිණෙන හෝ ඉන් පිටවන හෝ ශ්‍රී ලංකා ජලතීරයට පැමිණීමට හෝ ඉන් පිටවීමට තැත් කරන අවස්ථාවක, ඒ නැවේ අයිති

කරු, ක්‍රියා කරවන්නා හෝ නෞකාධිපතිවරයා වරදකට වරදකරු විය යුතු අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(4) (2) වන උපවගන්තියෙන් නියමිත පරිදි සහතිකයක් ගෙන යාම නැවක් විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක හෝ සහතිකයක් ඉදිරිපත් කිරීම නැවේ නෞකාධිපතිවරයා විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, නැවේ අයිතිකරු, ක්‍රියාකරවන්නා හෝ නෞකාධිපතිවරයා වරදකට වරදකරු විය යුතු අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(5) නැවක් මේ වගන්තිය කඩ කරමින් ශ්‍රී ලංකාවේ වරායකින් පිටවීමට තැත් කරන අවස්ථාවක, අධිකාරිය විසින් ඒ නැව රඳවා ගනු ලැබිය හැකි ය.

## IV වන කොටස

### දූෂණය වැළැක්වීමේ ක්‍රියා මාර්ග

*තෙල් හා දූෂක ද්‍රව්‍යවලට අදාළ වාර්තා පොත්.*

10. (1) ශ්‍රී ලංකා ජලතීරයෙහි සියලු නැව් විසින් තෙල් හා වෙනත් දූෂක ද්‍රව්‍ය පිළිබඳ වාර්තා පොත් ගෙන යනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් නැවක නෞකාධිපතිවරයා විසින් නැවෙහි හෝ නැව සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණුවලට අදාළ මෙහෙයුම් කිරීම් තෙල් පිළිබඳ වාර්තා පොතෙහි වාර්තා කළ යුතු ය:—

(අ) නැව්බඩු වශයෙන් වූ තෙල් නැවට පැටවීම;

(ආ) ශ්‍රී ලංකා ජලතීරයෙහි දී නැව්බඩු වශයෙන් වූ තෙල් නැවකට හෝ නැවකින් මාරු කිරීම;

(ඇ) නැව්බඩු වශයෙන් වූ තෙල් පිටකිරීම;

(ඈ) (නැව්බඩු හෝ බන්කර ඉන්ධන ටැන්කි වූ) තෙල් ටැන්කිවලට පිරවුම් ද්‍රව්‍ය ඇමීම සහ එවැනි ටැන්කිවලින් පිරවුම් ද්‍රව්‍ය පිටකිරීම සහ ඒ ටැන්කි ශුද්ධ කිරීම;

(ඉ) තෙල් අඩංගු යම් මිශ්‍රණයක, ජලයෙන් හෝ වෙනත් ද්‍රව්‍යවලින් තෙල් වෙන් කිරීම;

(ඊ) වෙනත් යම් තෙල් අවශේෂයන් බැහැර කිරීම;

(උ) ඉහතින් වූ අනුඡේදයෙහි සඳහන් යම් කරුණුවලට අදාළ මෙහෙයුම්වලින් උද්ගත වන තෙල් හෝ ජලය හෝ වෙනත් යම් ද්‍රව්‍ය බැහැර කිරීම;

(ඌ) යම් නැවක ආරක්ෂාව ඇති කිරීමේ හෝ යම් නැවකට හෝ නැව්බඩුවලට හානි වැළැක්වීමේ හෝ මනුෂ්‍ය ජීවිත ආරක්ෂා කිරීමේ කාර්ය සඳහා තෙල් හෝ තෙල් අඩංගු මිශ්‍රණයක් නැවෙන් පිටකරනු ලබන යම් අවස්ථාවක්;

(එ) නැවට සිදු වූ හානියක ප්‍රතිඵලය වශයෙන් හෝ කාන්දුවීමේ හේතුවෙන්, නැවෙන් තෙල් හෝ තෙල් අඩංගු මිශ්‍රණයක් කාන්දු වන බව හෝ කාන්දු ඒ ඇති බව සොයා ගනු ලබන යම් අවස්ථාවක්; සහ

(ඒ) නියම කරනු ලබන වෙනත් මෙහෙයුම්.

(3) (1) වන උපවගන්තිය යටතේ තබා ගැනීමට නියමිත යම් වාර්තා නැවේ නෞකාධිපතිවරයා හෝ නැව භාරව සිටින තැනැත්තා විසින් තබා ගත යුතු අතර, ඒ නැව බත්තලක් වන අවස්ථාවක—

(i) ඒවා බත්තලට තෙල් මාරුකිරීමට අදාළ වන තාක් දුරට, තෙල් සපයන තැනැත්තා විසින් ; සහ

(ii) ඒවා බත්තලින් තෙල් මාරුකිරීමට අදාළ වන තාක් දුරට, තෙල් භාර දෙනු ලබන්නේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා විසින්

තබා ගනු ලැබිය යුතු ය.

(4) නිල ලොග් පොතක් වශයෙන් හෝ වෙන ම ලොග් පොතක් වශයෙන් ගෙන යනු ලබන වාර්තා පොතෙහි නියම කරනු ලබන දූෂක ද්‍රව්‍ය පිට කිරීමට හෝ පිටවීමට අදාළ වාර්තා (1) වන උපවගන්තියෙහි සඳහන් නැවක නෞකාධිපතිවරයා විසින් වාර්තාගත කළ යුතු ය.

(5) මේ වගන්තිය යටතේ තබා ගනු ලැබිය යුතු වාර්තා පොත සහ වෙනත් වාර්තා නියමිත ආකෘතියට සරානුකූල විය යුතු ය.

(6) යම් නැවක් වාර්තා පොතක් ගෙන යාම පැහැර හැරියහොත්, ඒ නැවේ අයිතිකරු, ක්‍රියාකරවන්නා, අනුයෝජිතයා හෝ නෞකාධිපතිවරයා වරදකට වරදකරු විය යුතු ය.

(7) මේ වගන්තිය යටතේ ගෙන යනු ලබන යම් වාර්තා පොතක හෝ තබා ගනු ලබන යම් වාර්තාවක යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් තමාගේ දැනීම අනුව ව්‍යාජ වූ හෝ මුළා කරන සටහනක් කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු ය.

(8) තෙල් සහ වෙනත් දූෂක ද්‍රව්‍ය සම්බන්ධයෙන් වූ වාර්තා පොත් සියලු යුක්ති සහගත වේලාවන්හි දී පරීක්ෂා කිරීම සඳහා පහසුවෙන් ලබාගත හැකි යම් ස්ථානයක තැබිය යුතු අතර, ඇද ගෙන යනු ලබන, නාවියන් රහිත නැව් සම්බන්ධයෙන් වන විට හැර, නැවෙහි තැබිය යුතු ය. අවසාන සටහන කිරීමෙන් පසු අවුරුදු දෙකක කාලයක් තුළ ඒවා ආරක්ෂා කර තැබිය යුතු ය.

(9) ශ්‍රී ලංකා ජලතීරය ඇතුළත තිබෙන අතරතුර, යම් නැවක් මත තෙල් වාර්තා පොත හෝ දූෂක ද්‍රව්‍යවලට අදාළ වාර්තා පොත අධිකාරිය විසින් හෝ අධිකාරිය විසින් ලිඛිතව බලය දෙන ලද යම් නිලධරයකු විසින් හෝ පරීක්ෂා කරනු ලැබිය හැකි අතර, තෙල් හෝ වෙනත් දූෂක ද්‍රව්‍ය සම්බන්ධයෙන් වාර්තා පොතෙහි කර ඇති සටහන්වල සහතික කළ සත්‍ය පිටපතක් අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලෙස නැවේ නෞකාධිපතිවරයාට නියම කරනු ලැබිය හැකි ය.

(10) (6) වන උපවගන්තිය හෝ (7) වන උපවගන්තිය යටතේ වරදකට වරදකරු වන යම් තැනැත්තකු, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(11) මේ පනත යටතේ යම් නඩු කටයුතුවල දී—

(අ) මේ වගන්තිය ප්‍රකාර ගෙන යන ලද යම් වාර්තා පොතක් හෝ තබන ලද වාර්තා එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් සාක්ෂි වශයෙන් ආවේශ්‍ය විය යුතු ය ;

(ආ) යම් වාර්තා පොතක හෝ යම් වාර්තාවක කරන ලද සටහනක පිටපතක් ඒ සටහනේ සත්‍ය පිටපතක් බවට, වාර්තා පොත ගෙනයනු ලබන්නේ යම් නැවක නම් ඒ නැවේ නෞකාධිපතිවරයා විසින් හෝ ඒ වාර්තාව තබාගැනීමට යම් තැනැත්තකුට නියම කරනු ලබන්නේ නම් ඒ තැනැත්තා විසින් හෝ සහතික කරනු ලබන අවස්ථාවක, ඒ පිටපත එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් සාක්ෂි වශයෙන් ආවේශ්‍ය විය යුතු ය;

(ඇ) මේ වගන්තිය ප්‍රකාර ගෙන යනු ලබන වාර්තා පොතක් හෝ තබා ගනු ලබන වාර්තාවක් යයි කියනු ලබන නැතහොත් මේ උපවගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් පරිදි සහතික කරන ලද පිටපතක් යයි කියනු ලබන යම් ලේඛනයක්, එසේ නොවන බවට ඔප්පු කරතහොත් මිස, අවස්ථාවෝචිත පරිදි, එවැනි පොතක්, වාර්තාවක් හෝ පිටපතක් යයි පූර්ව නිගමනය කළ යුතු ය.

තෙල් මාරු කිරීම පිළිබඳ සීමා.

11. (1) අධිකාරිය වෙත දැන්වීමක් කරනු ලැබ, එහි පූර්ව අනුමතය ලබා ගෙන ඇත්නම් මිස, පස්වරු 6 සිට පෙරවරු 6 දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකා ජලතීරය ඇතුළත නැවකට හෝ නැවකින් තෙල් මාරු කිරීම කිසිම නැවක අයිතිකරුවකු, ක්‍රියාකරවන්නකු, නෞකාධිපතිවරයකු හෝ අනුයෝජිතයකු විසින් නො කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් දැන්වීමෙහි—

(අ) තෙල් මාරුකිරීම සිදු කරනු ලබන ස්ථානය; සහ

(ආ) තෙල් මාරුකිරීම ක්‍රියාත්මක කරනු ලබන්නේ කවර වේලාවල් සහ කාලය ඇතුළත ද යන වග

සඳහන් කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියෙහි සඳහන් කාලය කිසිම කාරණයක දී අනුමතයේ දින සිට මාස දොළහක කාලයක් නොඉක්මවිය යුතු ය.

(4) මේ වගන්තියේ යම් විධිවිධානයක් කඩකරන්නා වූ, අවස්ථාවෝචිත පරිදි, නැවක අයිතිකරු, ක්‍රියාකරවන්නා, නෞකාධිපතිවරයා හෝ අනුයෝජිතයා වන්නා වූ යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක්ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

ශ්‍රී ලංකා ජලතීරයට තෙල් හෝ වෙනත් දූෂක ද්‍රව්‍යයක් පිට කිරීම වාර්තා කිරීමේ යුතුකම.

12. කවර වූ හෝ හේතුවක් නිසා—

(අ) නැවකින්;

(ආ) තෙල් හෝ වෙනත් දූෂක ද්‍රව්‍යයක් මාරු කිරීමට පාවිච්චි කරනු ලබන උපකරණයකින්;

(ඇ) අක්වෙරළේ ඉදිකිරීමකින්;

(ඇ) නල මාර්ගයකින් ;

(ඉ) ගොඩබිම ස්ථානයකින්

ශ්‍රී ලංකා ජලතීරයට තෙල් හෝ වෙනත් දූෂක ද්‍රව්‍යයක් පිටකරනු ලැබුවහොත්, පිටවුවහොත් හෝ දමනු ලැබුවහොත්, එවිට අවස්ථාවෝචිත පරිදි, නැවේ අයිතිකරු, ක්‍රියාකරවන්නා, නෞකාධිපතිවරයා හෝ අනුයෝජිතයා නැතහොත් උපකරණයේ අයිතිකරු හෝ එය භාරව සිටින තැනැත්තා නැතහොත් අක්වෙරළේ ඉදිකිරීමේ, නල මාර්ගයේ හෝ ගොඩබිම ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් ඒ සිද්ධිය පිළිබඳ සියලු විස්තර අධිකාරිය වෙත වහාම වාර්තා කළ යුතු ය. තව ද ඔහු එසේ කිරීම පැහැර හැරියහොත්, ඔහු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක්ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

## V වන කොටස

### ප්‍රතිග්‍රහණ පහසුකම් සහ නැව්වල උපකරණ

13. (1) ශ්‍රී ලංකාවේ වරායවල් පාවිච්චි කරන හෝ ශ්‍රී ලංකා ජල තීරය පරික්‍රමණය කරන නැව්වලට තෙල් අවශේෂයන් හෝ වෙනත් දූෂක ද්‍රව්‍ය පිටකිරීමට හෝ නැන්පත් කිරීමට හැකි වන සේ ශ්‍රී ලංකාවේ යම් වරායක් ඇතුළත හෝ ඉන් පිටත ප්‍රතිග්‍රහණ පහසුකම් සැලසීමට අධිකාරියට බලය ඇත්තේ ය. තෙල් හෝ දූෂක ද්‍රව්‍ය පිටකිරීමට හෝ නැන්පත් කිරීමට ප්‍රතිග්‍රහණ කිරීමේ පහසුකම්.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් පහසුකම් සැලසීමේ දී අධිකාරිය විසින් වෙනත් යම් තැනැත්තකුගේ සහාය ලබාගත හැකි ය. නැතහොත් වෙනත් යම් තැනැත්තකු විසින් ඒ පහසුකම් සැලසීම සඳහා කටයුතු සංවිධාන කළ හැකි ය.

(3) (අ) පහසුකම් පාවිච්චි කිරීම සම්බන්ධයෙන් අය කරනු ලබන ගාස්තු ; සහ

(ආ) නැව් විසින් ඒ පහසුකම් පාවිච්චි කිරීමේ දී බලපැවැත් විය යුතු කොන්දේසි

නියම කරමින් නියෝග සාදනු ලැබිය හැකි ය.

14. (1) තෙල් හෝ වෙනත් යම් දූෂක ද්‍රව්‍යයක් පිටකිරීම වැළැක්වීම සඳහා නියෝගවලින් නියම කරනු ලබන උපකරණ ශ්‍රී ලංකා ජලතීරයට ඇතුළු වන සෑම නැවකම සවි කර තිබිය යුතු අතර, නියෝගවලින් නියම කරනු ලබන ඒ වැළැක්වීමට අදාළ හෝ ආනුෂංගික නියමයන් ඒ සෑම නැවක් විසින් ම පිළිපැදිය යුතු ය. දූෂණය වැළැක්වීමට නැව්වල උපකරණ.

(2) යම් නැවක් සම්බන්ධයෙන්, එම නැවට අදාළ වන මේ වගන්තිය යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධාන කඩකරනු ලැබුවේ නම්, ඒ නැවේ අයිතිකරු, ක්‍රියාකරවන්නා, නෞකාධිපතිවරයා හෝ අනුයෝජිතයා වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක්ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

## VI වන කොටස

## සමුද්‍ර විපත්

සමුද්‍ර විපත්.

15. (1) යම් සමුද්‍ර විපතකින් හෝ එහි ප්‍රතිඵලය වන යම් ක්‍රියාවකින් ශ්‍රී ලංකා ජලතීරය හෝ එහි පෙරවෙරළ හෝ ඒ ජලතීරයට හෝ පෙරවෙරළට අදාළ යම් සම්බන්ධතාවන් දූෂණය වන හෝ දූෂණය වීමේ ආසන්න තර්ජනයක් ඇති වන අවස්ථාවක අමාත්‍යවරයා විමසීමෙන් පසු අධිකාරිය විසින්—

(අ) නැවේ අයිතිකරුට හෝ නැවේ සන්තකය ඇති යම් තැනැත්තකුට;

(ආ) නැවේ නෞකාධිපතිවරයාට;

(ඇ) නැවේ සන්තකය ඇති යම් නැව් බේරාගන්නකුට හෝ නැවේ සන්තකය ඇති සහ බේරා ගැනීමේ කටයුතු භාර යම් නැව් බේරාගන්නකුගේ සේවකයකු හෝ අනුයෝජිතයකු වන යම් තැනැත්තකුට;

(ඈ) අධිකාරිය විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය දෙන ලද වෙනත් යම් තැනැත්තකුට

ඒ දූෂණය විම හෝ ඒ දූෂණය වීමේ තර්ජනය හෝ වැළැක්වීමට, අඩු කිරීමට හෝ ඉවත් කිරීමට අවශ්‍ය වන පියවර ඒ නැව හෝ එහි නැව්බඩු සම්බන්ධයෙන් ගන්නා ලෙස විධාන කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුට නිකුත් කරන ලද විධානවලින්—

(අ) නැව නිශ්චිතව සඳහන් කළ තැනකට ගෙන යා යුතු බවට හෝ නිශ්චිතව සඳහන් කළ ප්‍රදේශයකින් හෝ ස්ථානයකින් ඉවත් කරනු ලැබිය යුතු බවට;

(ආ) නැව නිශ්චිතව සඳහන් කළ තැනකට හෝ ප්‍රදේශයකට හෝ ස්ථානයකට හෝ නිශ්චිතව සඳහන් කළ මාර්ගයක් ඔස්සේ හෝ නොගෙන යා යුතු බවට;

(ඇ) තෙල් හෝ වෙනත් නැව්බඩු පැටවීම හෝ ගොඩබෑම හෝ පිට කිරීම හෝ කළ යුතු බවට නැතහොත් නොකළ යුතු බවට;

(ඈ) නිශ්චිතව සඳහන් කළ බේරාගැනීමේ ක්‍රියාමාර්ග ගනු ලැබිය යුතු බවට හෝ නොගනු ලැබිය යුතු බවට

නියම කරනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයාගේ මතය අනුව දූෂණය හෝ දූෂණය පිළිබඳ අවදානම වැළැක්වීමේ හෝ අඩු කිරීමේ කාර්ය සඳහා (2) වන උපවගන්තිය යටතේ පවරන ලද බලතල ප්‍රමාණවත් නොවේ නම් හෝ ප්‍රමාණවත් නොවන බව ඔප්පු වී ඇත් නම් අමාත්‍යවරයා විසින්—

(අ) නැව හෝ එහි යම් කොටසක් හෝ ගිල්වීම හෝ විනාශ කිරීම සඳහා මෙහෙයුම් භාර ගැනීම;

(ආ) නැවේ පාලනය අත්කර ගැනීම ඇතුළත් වන මෙහෙයුම් භාර ගැනීම

කරනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තිය යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කිරීමට නියම කරන ලද ක්‍රියාවක් සම්බන්ධයෙන් අමාත්‍යවරයාට හෝ අධිකාරියට හෝ අමාත්‍යවරයා විසින් බලය දෙන ලද යම් තැනැත්තකුට විරුද්ධව මන්දි ඉල්ලා යම් සිවිල් අධිකරණයක කිසිම නඩුවක් නොපවරනු ලැබිය යුතු ය.

15 වන වගන්තිය යටතේ ගනු ලබන ක්‍රියාමාර්ග සැබෑ හෝ අපේක්ෂිත හානියට සමානුපාත විය යුතු බව.

16. (1) 15 වන වගන්තිය යටතේ අධිකාරිය විසින් දෙන ලද යම් විධානයක් ප්‍රකාර යම් ක්‍රියාවක් කරන සෑම තැනැත්තකු විසින් ම—

(අ) දූෂණය හෝ ඇතිවිය හැකි දූෂණය වැළැක්වීම හෝ අඩු කිරීම පිණිස කරන ලද යම් ක්‍රියාවක් ඒ දූෂණයෙන් සිදු වන සැබෑ හානියට හෝ ඇතිවිය හැකි හානියට සමානුපාත විය යුතු බවට ;

(ආ) කොඩිය අයත් රාජ්‍යයේ, තෘතීය රාජ්‍යයේ සහ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම් සහ සම්බන්ධතා කෙරෙහි නිසි සැලකිල්ල දැක්විය යුතු බවට

වග බලා ගත යුතු ය.

(2) (අ) 15 වන වගන්තිය යටතේ දෙන ලද යම් විධානයක් කඩකරන්නා වූ හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ ;

(ආ) 15 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් විධාන ප්‍රකාර ක්‍රියා කිරීමට බලය දෙන ලද යම් තැනැත්තකුට ඕනෑකමින් ම බාධාකරන්නා වූ

සෑම තැනැත්තකු ම වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක් නො ඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ යම් තැනැත්තකුට චෝදනා කරනු ලැබූ අවස්ථාවක 15 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් විධානයක් අනුව ක්‍රියා කරනු ලබන බවට වග බලා ගැනීමට තමා නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කළ බව, නැතහොත් එවැනි විධාන යක් අනුව ක්‍රියා කිරීමෙන් මනුෂ්‍ය ජීවිත කෙරෙහි බරපතල අවදාන මක් සිදු විය හැකි බව විශ්වාස කිරීමට තමාට සාධාරණ හේතු තිබූ බව ඔප්පු කිරීම විත්තිවාචකයක් විය යුතු ය.

## VII වන කොටස

### ජාත්‍යන්තර සම්මුති ක්‍රියාත්මක කිරීම

ජාත්‍යන්තර සම්මුති ක්‍රියාත්මක කිරීමෙහි ලා අමාත්‍යවරයාගේ බලතල.

17. (1) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව ස්ථිර කරන හෝ පිළිගන්නා හෝ ප්‍රාප්ත වන හෝ අනුමත කරන හෝ සමුද්‍ර දූෂණය පිළිබඳ යම් ජාත්‍යන්තර සම්මුතියක විධිවිධාන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විය හැකි පියවර ගැනීමට අමාත්‍යවරයාට බලය ඇත්තේ ය.

(2) (1) වන උපවගන්තියේ ව්‍යාප්තියට හානියක් නොමැතිව ඒ සම්මුතිවලට—

(අ) 1954 තෙල්වලින් සමුද්‍රය දූෂණය වීම වැළැක්වීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය සහ තදනන්තර සංශෝධන ;

(ආ) 1969 තෙල් දූෂණ හානි සම්බන්ධයෙන් වූ සිවිල් වගකීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය ;

(ඇ) 1971 තෙල් දූෂණ හානි සඳහා වන්දි ගෙවීම සඳහා වූ ජාත්‍යන්තර අරමුදලක් පිහිටුවීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය ;

(ඈ) 1969 තෙල් දූෂණ විපත් සම්බන්ධයෙන් මහා මුහුදේ මැදිහත්වීමට අදාළ ජාත්‍යන්තර සම්මුතිය ;

(ඉ) 1973 නැව්වලින් සිදුවන දූෂණය වැළැක්වීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය සහ 1978 සන්ධානය

ඇතුළත් විය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ යම් බලතල ක්‍රියාත්මක කිරීමට පෙර අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමතය ලබා ගත යුතු ය.

අතිරේක විත්ති වාචක.

18. (1) ශ්‍රී ලංකා ආණ්ඩුව 1969 තෙල් දූෂණ හානි සම්බන්ධයෙන් වූ සිවිල් වගකීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියට ප්‍රාප්ත වුවහොත් මේ පනතේ II වන කොටස යටතේ නඩුවක් පවරනු ලැබූ තැනැත්තකුට පහත දැක්වෙන අතිරේක විත්ති වාචක ලබාගත හැකි වන්නේ ය:—

(අ) ඒ හානියට මුළුමනින්ම හේතු වූයේ හානි සිදුකිරීමේ චේතනාවෙන් තෘතීය පාර්ශ්වයක් විසින් කරන ලද යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් නම්, කිසිම වගකීමට යටත් වීමක් නොවිය යුතු ය ;

(ආ) ඒ හානියට මුළුමනින්ම හේතු වූයේ යම් ආණ්ඩුවක හෝ පහන් නැතහොත් වෙනත් යාත්‍රා ආධාර පවත්වා ගෙන යාම සඳහා වගකිව යුතු වෙනත් අධිකාරියක නොසැලකිලිමත්කම හෝ වෙනත් වැරදි ක්‍රියාවක් නම් කිසිම වගකීමට යටත් වීමක් නොවිය යුතු ය.

(2) ශ්‍රී ලංකා ආණ්ඩුව 1971 තෙල් දූෂණ හානි සඳහා වන්දි ගෙවීම සඳහා වූ ජාත්‍යන්තර අරමුදලට ප්‍රාප්ත වුවහොත්, ඒ සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ යම් නඩු කටයුතු මහාධිකරණය ඉදිරියේ පවරනු ලැබිය යුතු අතර, වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ඒ අධිකරණයට ඒ සම්මුතියෙන් විධිවිධාන සලසන ලද උපරිම වගකීමට යටත්වීම නියම කිරීමට අධිකරණ බලය තිබිය යුතු ය.

## VIII වන කොටස

## විවිධ විධිවිධාන

19. (1) අධිකාරිය විසින් තත් කාර්ය සඳහා සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය දෙන ලද යම් තැනැත්තකු විසින්— පරීක්ෂා කිරීම, සමීක්ෂණය කිරීම ආදිය සඳහා බලතල.

(අ) ශ්‍රී ලංකා ජලතීරය ඇතුළත තිබෙන හෝ ඒ ජලතීරයට ඇතුළු වීමට ආසන්න යම් නැවක නෞකාධිපතිවරයාට හෝ ක්‍රියාකරවන්නාට හෝ අනුයෝජිතයාට—

(i) නැවේ තත්ත්වය, එහි යන්ත්‍ර සහ උපකරණ සම්බන්ධයෙන් ;

(ii) එහි නැව්බඩුවල ස්වභාවය සහ තත්ත්වය සම්බන්ධයෙන් ;

(iii) නැවේ නැව්බඩු සහ ඉන්ධන සහ ඒ නැව්බඩු සහ ඉන්ධන ගබඩාකර ඇති ආකාරය සහ ගබඩාකර ඇති ස්ථාන සම්බන්ධයෙන් ; සහ

(iv) නැවට හෝ නැවේ ඇති නැව් බඩුවලට අදාළව අධිකාරිය විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් කරුණු පිළිබඳව

තොරතුරු සැපයීමට නියම කිරීම;

(ආ) ශ්‍රී ලංකා ජලතීරය ඇතුළත තිබෙන යම් නැවකට ගොඩවී ඒ නැව මේ පනතින් හෝ ඒ යටතේ සාදන ලද නියෝග වලින් කර ඇති නියමයන්ට අනුකූල වන්නේ දැයි තීරණය කිරීමට ඔහුට ආධාරවන පරීක්ෂණ හා අත්හද බැලීම් පැවැත්වීම;

(ඇ) මේ පනතින් හෝ ඒ යටතේ සාදන ලද නියෝගවලින් යම් නැවක් සම්බන්ධයෙන් තබාගැනීමට නියම කරන ලද යම් වාර්තා පරීක්ෂා කිරීම සහ එවැනි යම් වාර්තාවක යම් සටහනක් පිටපත් කරවීම සහ ඒ වාර්තා තබාගත යුතු තැනැත්තා විසින් ඒ පිටපත සටහනේ සත්‍ය පිටපතක් ලෙස සහතික කිරීමට නියම කිරීම;

(ඈ) අක්වෙරළේ යම් ඉදිකිරීමක්, උපකරණයක්, නල මාර්ගයක් හෝ ගොඩබිම් ස්ථානයක් වෙත පැමිණ ඒ ඉදිකිරීම, උපකරණය, නල මාර්ගය හෝ ගොඩබිම් ස්ථානය මේ පනතින් හෝ ඒ යටතේ සාදන ලද නියෝගවලින් කර ඇති නියමයන්ට අනුකූල වන්නේ දැයි තීරණය කිරීමට ඔහුට ආධාර වන යම් පරීක්ෂණ පැවැත්වීම;

(ඉ) යම් නැවකට, ඔහු විසින් විධාන කරනු ලබන මාර්ගයකින් සහ ආකාරයකින් ශ්‍රී ලංකා ජලතීරයෙන් පිටතට යාමට, ඒ ජලතීරයෙන් පිටත නතර කිරීමට හෝ ඉදිරියට ගෙන ඔහු විසින් නියම කරනු ලබන සාධාරණ කාලයක්

ශ්‍රී ලංකා ජලතීරය ඇතුළත ඔහු විසින් තෝරා ගනු ලැබූ යම් ස්ථානයක යාත්‍රා බැඳ තැබීමට, නැංගුරම්ලෑමට හෝ නතර කිරීමට නියම කිරීම—

(i) මේ පනත යටතේ සාදනු ලැබ ඒ නැවට අදාළ වන හෝ අදාළ කරනු ලැබිය හැකි යම් නියෝගයක් අනුව ක්‍රියා කිරීම ඒ නැව පැහැර හරින බව සාධාරණ හේතු මත ඔහු සැක කරන්නේ නම්; හෝ

(ii) කාලගුණය, දෘශ්‍යතාව හෝ මුහුදු තත්ත්වයන්, නැවේ හෝ එහි යම් උපකරණයක තත්ත්වය හෝ එහි නැවියන් සංඛ්‍යාවෙහි අඩුවක් හෝ එහි නැව්බඩුවල ස්වභාවය හා තත්ත්වය හේතු කොට ගෙන, ඒ නියමය සාධාරණ වන බවට සහ තෙල් හෝ වෙනත් දූෂක ද්‍රව්‍යයක් පිටකිරීම, පිටවීම හෝ දැමීම ඉන් වැළැක්වෙන බවට ඔහු සෑහීමට පත් වන්නේ නම් හෝ

කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තියෙන් පිරිනමන ලද යම් බලතල ක්‍රියාත්මක කරන යම් තැනැත්තකු විසින් නැව අසාධාරණ ලෙස රඳවා ගැනීම හෝ යම් මුහුදු ගමනක යෙදීම ප්‍රමාද කිරීම හෝ නොකරනු ලැබිය යුතු ය.

(3) නැවට සවිකර තිබිය යුතු යයි මේ පනතින් හෝ ඒ යටතේ සාදන ලද නියෝගවලින් නියම කරන ලද උපකරණ සහ යන්ත්‍ර පිළිබඳ යම් පරීක්ෂා පැවැත්වීම සඳහා අය කරනු ලබන යම් ගාස්තු අමාත්‍යවරයා විසින් නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ය.

(4) ශ්‍රී ලංකා ජලතීරයට සැලකිය යුතු ප්‍රමාණයක තෙල් හෝ වෙනත් දූෂක ද්‍රව්‍යයක් පිටකරනු ලැබ හෝ, එටවී හෝ දමනු ලැබ ඇති බව අධිකාරිය වෙත දැනුම් දෙන ලද අවස්ථාවක, නැතහොත් ශ්‍රී ලංකා ජලතීරයට තෙල් හෝ වෙනත් දූෂක ද්‍රව්‍යයක් පිළිබඳ සැලකිය යුතු ප්‍රමාණයක පිටකිරීමක්, පිටවීමක් හෝ දැමීමක් සිදුවීමේ බරපතල සහ අත්‍යාසන්න අන්තරායක් පවත්නා බවට අධිකාරිය සෑහීමට පත්වන අවස්ථාවක—

(අ) ශ්‍රී ලංකා ජලතීරයේ නිශ්චිතව සඳහන් කළ ප්‍රදේශයක් ඇතුළත ඇති සියලු නැව්වලට ඒවායේ පිහිටුම්, අධිකාරියට වාර්තා කිරීමට නියම කිරීම;

(ආ) තෙල් හෝ වෙනත් දූෂක ද්‍රව්‍යයක් පාලනය කිරීමට හෝ පැතිරියාම වැළැක්වීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් හෝ ඒ දූෂණය ඉවත් කිරීමට සහභාගි වන මෙන් හෝ යම් නැවකට නියම කිරීම, හෝ යම් උපකරණයක, නල මාර්ගයක, අක්වෙරළේ ඉදිකිරීමක හෝ ගොඩබිම ස්ථානයක අයිතිකරුට, ක්‍රියා කරවන්නාට හෝ භාරව සිටින තැනැත්තාට උපදෙස් දීම

අධිකාරිය විසින් කරනු ලැබිය හැකි ය.

**යම් ඉඩමකට හෝ ස්ථානයකට ඇතුළුවීමේ බලය.**

**20.** (1) ශ්‍රී ලංකා ජලතීරයෙන් තෙල් හෝ වෙනත් දූෂක ද්‍රව්‍යයක් අස් කිරීමේ හෝ ඉවත් කිරීමේ කාර්ය සඳහා මුහුදට හෝ පෙරවෙරළට හෝ යාබද යම් ඉඩමකට නැතහොත් ස්ථානයකට යම් සාධාරණ වේලාවක දී අධිකාරිය විසින් හෝ තත් කාර්ය සඳහා අධිකාරිය විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් ඇතුළුවීම සහ ඉන් පසු අධිකාරියේ යම් වැඩක් ක්‍රියාත්මක කිරීමේ හෝ බලගැන්වීමේ කාර්ය සඳහා හෝ අධිකාරියේ යම් බලයක් ක්‍රියාත්මක කිරීමට, යම් කර්තව්‍යයක් කිරීමට හෝ යම් කාර්යයක් ඉටු කිරීමට ප්‍රාරම්භ වූ හෝ ආනුෂංගික වූ යම් මැනීමක්, පරීක්ෂණයක් හෝ විමර්ශනයක් කිරීම සඳහා හෝ සාධාරණ වශයෙන් අවශ්‍ය ක්‍රියා කිරීම නීත්‍යනුකූල වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී අධිකාරිය විසින් යම් ක්‍රියාවකින්, නොසැලකිලිමත් කමකින් හෝ පැහැර හැරීමකින් යම් තැනැත්තකුගේ දේපළවලට යම් හානියක් සිදු කරනු ලැබුවහොත් ඒ හානිය සම්බන්ධයෙන් වන්දි ගෙවීමට අධිකාරිය බැඳී සිටින්නේ ය.

(3) තම දේපළ සම්බන්ධයෙන් යම් හානියක් සිදු වූ කිසිම තැනැත්තකුට, වන්දි වශයෙන් හැර අධිකරණයක දී යම් ප්‍රති කර්මයකට හෝ සහනාදානයකට හෝ සහනයකට හිමිකම නොලැබිය යුතු ය.

(4) ඒ හානියේ ප්‍රමාණය පිළිබඳව ආරාවුලක් ඇති වූ විට එය අවස්ථෝචිත පරිදි මහාධිකරණය හෝ කොළඹ දිසා අධිකරණය විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

**සහයෝගයෙන් ක්‍රියාකිරීමේ යුතුකම.**

**21.** (1) යම් නැවක නෞකාධිපතිවරයා විසින් හෝ යම් උප කරණයක්, නල මාර්ගයක්, අක්වෙරළෙහි ඉදිකිරීමක් හෝ ගොඩබිම යම් ස්ථානයක් භාරව සිටින තැනැත්තකු විසින් හෝ අධිකාරියට හෝ අධිකාරිය විසින් තත් කාර්ය සඳහා ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තකුට මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග යටතේ ස්වකීය කාර්ය හෝ කර්තව්‍ය කිරීමට අධිකාරියට හෝ එසේ බලය දෙන ලද තැනැත්තකුට හැකි වන අයුරින් සැලසීමට තමාට හැකි සෑම සාධාරණ සහායක් දිය යුතු ය ; තව ද ඒ අධිකාරිය හෝ එසේ බලය දෙන ලද යම් තැනැත්තකු විසින් සාධාරණ ලෙස නියම කරනු ලබන තොරතුරු සැපයිය යුතු ය.

(2) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග යටතේ වූ ස්වකීය කාර්ය හෝ කර්තව්‍ය කිරීමෙහි ලා අධිකාරියට හෝ එසේ බලය දෙන ලද යම් තැනැත්තකුට කිසිම තැනැත්තකු විසින් බාධාවක් හෝ අවහිරයක් නොකරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග යටතේ ස්වකීය කාර්ය හෝ කර්තව්‍ය කිරීමෙහි ලා අධිකාරියට හෝ එසේ බලය දෙන ලද යම් තැනැත්තකුට බාධා කරන හෝ අවහිර කරන යම් තැනැත්තකු මේ වගන්තිය යටතේ වරදකට වරදකරු වන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

නැව රඳවා ගැනීමේ බලය.

22. මේ පනත යටතේ පවරනු ලැබිය හැකි නඩු කටයුතු කවර වුව ද යම් නැවකින් ශ්‍රී ලංකා ජලතීරයට තෙල් හෝ වෙනත් දූෂක ද්‍රව්‍යයක් පිටකරනු ලැබූ බව විශ්වාස කිරීමට තමන්ට සාධාරණ හේතු ඇත්නම් අධිකාරිය විසින් හෝ අධිකාරිය විසින් ලිඛිතව බලය දෙන ලද යම් තැනැත්තකු විසින් ඒ නැව රඳවා ගනු ලැබිය හැකි ය. තවද අධිකාරියේ මතය අනුව මේ පනත යටතේ වූ නැවේ අයිතිකරුගේ, ක්‍රියාකරවන්නාගේ, නෞකාධිපතිවරයාගේ හෝ අනුයෝජිතයාගේ වගකීම පියවීමට ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් අධිකාරිය වෙත තැන්පත් කිරීම හෝ ඇපයක් තැබීම ඒ අයිතිකරු, ක්‍රියාකරවන්නා, නෞකාධිපතිවරයා හෝ අනුයෝජිතයා විසින් කරනු ලබන තෙක් නැව එසේ රඳවා ගනු ලැබිය හැකි ය.

රඳවා ගනු ලැබූ නැව බැහැරට යාත්‍රා කිරීම.

23. (1) 22 වන වගන්තිය යටතේ යම් නැවක් රඳවා ගනු ලැබුව හොත් සහ නිසි අධිකාරිය විසින් ඒ නැව මුදා හරිනු ලැබීමට පෙර එය බැහැරට යාත්‍රා කළ හොත් ඒ නැව බැහැරට යාත්‍රා කිරීමේ ක්‍රියාවට පාර්ශ්වකරුවකු වූ හෝ සම්බන්ධ වූ නෞකාධිපතිවරයා, අයිතිකරු, ක්‍රියා කරවන්නා, අනුයෝජිතයා හෝ වෙනත් යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන්නා වූ දඩයකට යටත් විය යුතු ය.

(2) යම් නැවක් රඳවා ගැනීමට මේ පනත යටතේ බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් අවශ්‍ය යයි අදහස් කරන්නේ නම් ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවන්ගේ සහාය ලබා ගත හැකි ය.

විදේශීය නැව රඳවා ගැනීම පිළිබඳව කොන්සල් නිලධරයාට දැනුම් දියයුතු බව.

24. (1) (අ) යම් විදේශීය නැවක් මේ පනත යටතේ රඳවා ගනු ලැබූ, සහ

(ආ) ඒ නැවේ නෞකාධිපතිවරයාට හෝ අයිතිකරුට විරුද්ධව මේ පනත යටතේ යම් නඩු කටයුතු පවරනු ලැබූ

කවර වූ හෝ අවස්ථාවක, ඒ නැව අයත් රට වෙනුවෙන් පෙනී සිටින හෝ නැව තත්කාලයෙහි ඇති වරායෙහි හෝ වරායට ඉතා ආසන්න වූ කොන්සල් නිලධරයාට නොපමාව දැන්වීම භාර දෙනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ භාර දෙනු ලැබිය යුතු දැන්වීමෙහි නැව රඳවා ගනු ලැබූ හෝ නඩු කටයුතු පවරනු ලැබූ හේතු සඳහන් කරනු ලැබිය යුතු ය.

දැන්වීම් ආදිය ලිඛිත විය යුතු බව.

25. යම් දැන්වීමක්, අධිකාරයක්, නියමයක්, විධානයක් හෝ වෙනත් නිවේදනයක් අධිකාරිය විසින් (මේ පනත යටතේ පත් කරන ලද නිලධරයකු නොවන) යම් තැනැත්තකුට දීමට හෝ කිරීමට මේ පනතින් හෝ ඒ යටතේ හෝ නියම කරනු ලැබූ හෝ බලය දෙනු ලැබූ අවස්ථාවක, එය ලිඛිතව කරනු ලැබිය යුතු ය; නැතහොත් දෙනු ලැබිය යුතු ය.

26. (1) මේ පනතේ කාර්ය සඳහා යම් තැනැත්තකු වෙත යම් ලේඛනයක් භාර දෙනු ලැබීමට ඇති අවස්ථාවක— ලේඛන භාරදීම.

(අ) කවර විටක වුව ද එය භාර දෙනු ලැබිය යුතු තැනැත්තාට එහි පිටපතක් පෞද්ගලිකව භාර දීමෙන් හෝ ඔහු පදිංචිව ඇතැයි දන්නා ස්ථානයෙහි ඒ පිටපත තැබීමෙන් හෝ ඒ පිටපත තැපැල් මගින් ප්‍රේෂණය කිරීමෙන් හෝ යැවීමෙන් ;

(ආ) (නැවක නෞකාධිපතිවරයකු ඇති අවස්ථාවක) නැවේ නෞකාධිපතිවරයා වෙත හෝ නැවකට අයත් පුද්ගලයකු වෙත ලේඛනය භාර දෙනු ලැබිය යුතු නම් ඔහුට ලැබීම පිණිස ඒ ලේඛනය නැවෙහි අණදීම හෝ නැව භාරව සිටින හෝ එලෙස පෙනී යන තැනැත්තා වෙත ඒ නැවෙහි තැබීමෙන් ; සහ

(ඇ) ලේඛනය නැවක නෞකාධිපතිවරයා වෙත භාර දෙනු ලැබිය යුතු වූ ද, නෞකාධිපතිවරයකු නොමැති වූ ද නැව ශ්‍රී ලංකා ජලතීරයෙහි ඇත්තා වූ ද අවස්ථාවක නැවේ කළමනාකාර අයිතිකරු වෙත හෝ කළමනාකාර අයිතිකරුවකු ශ්‍රී ලංකාවෙහි නොමැති නම් ශ්‍රී ලංකාවෙහි වාසය කරන්නා වූ, අයිතිකරුවකුගේ යම් අනුයෝජිතයකු වෙත හෝ එවැනි අනුයෝජිතයකු නොදන්නා හෝ සොයා ගනු ලැබිය නොහැකි අවස්ථාවක නැවේ යම් ප්‍රකට ස්ථානයක එහි පිටපතක් ඇලවීමෙන් හෝ

ඒ ලේඛනය භාර දෙනු ලැබිය හැකි ය.

(2) මුහුදු ගමන් සඳහා නුසුදුසු හෙයින් නැව රඳවා ගැනීමට අදාළව මේ පනත යටතේ යම් ලේඛනයක් නැවක නෞකාධිපතිවරයා වෙත භාර දීමට අවහිර කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, ඒ සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසක් නො ඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(3) (2) වන උපවගන්තියෙහි සඳහන් යම් අවහිර කිරීමකට පාර්ශ්වකරුවකු වන හෝ සම්බන්ධයක් ඇති නැවක යම් අයිතිකරුවකු හෝ නෞකාධිපතිවරයකු වරදක් කරන අතර, ඒ සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසක් නො ඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නො ඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

27. නැවේ අයිතිකරු, ක්‍රියා කරවන්නා, නෞකාධිපතිවරයා හෝ අනුයෝජිතයා මේ පනතේ විධිවිධාන යටතේ වරදකට වරදකරු කරනු ලැබ නියම කරන ලද යම් දඩයක් ගෙවීම හෝ දරන ලද යම් වගකීමක් ඉටු කිරීම හෝ අවස්ථාවෝචිත පරිදි මහාධිකරණය විසින් හෝ කොළඹ දිසා අධිකරණය විසින් ආඥා කරනු ලැබූ කාලය තුළ නොකරන ලද විට ගෙවීම බලාත්මක කිරීම සඳහා වූ යම් බලතලවලට අතිරේකව නොගෙවා ඇති මුදල් ප්‍රමාණය ඒ නැව, නැව් පන්නය, දූව භාණ්ඩ සහ වස්ත්‍ර තහනම් කොට විකිණීමෙන් ගෙවීමට විධාන කිරීමේ බලය ඒ අධිකරණයට ඇත්තේ ය. නැව විකිණීම

සන්නද්ධ නැව්වලට අදාළ නොවිය යුතු බව.

28. ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක නාවික හමුදාවට, යුද්ධ හමුදාවට හෝ ගුවන් හමුදාවට අයත් නැව්වලට මේ පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

අධිකරණවල අධිකරණ බලය.

29. (1) 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ පටහැණිව කුමක් සඳහන් ව ඇත ද ශ්‍රී ලංකා ජලතීරයෙහි කරන ලද මේ පනත යටතේ වූ සෑම වරදක් සම්බන්ධයෙන්, ශ්‍රී ලංකාවේ යම් අධිකරණ කලාපයක රැස්වන මහාධිකරණය විසින් හෝ අද්මිරාල්ති අධිකරණ බලය ක්‍රියාත්මක කරන මහාධිකරණය විසින් හෝ නඩු විභාග කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ II වන කොටසෙහි සඳහන් යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් පවරන ලද සෑම නඩුවක්ම, වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් ව ඇත ද, ශ්‍රී ලංකාවේ යම් අධිකරණ කලාපයක රැස්වන මහාධිකරණය විසින් හෝ අද්මිරාල්ති අධිකරණ බලය ක්‍රියාත්මක කරන මහාධිකරණය විසින් හෝ කොළඹ දිසා අධිකරණය විසින් හෝ නඩු විභාග කරනු ලැබිය යුතු ය. තව ද මේ පනතින් විධිවිධාන සලසනු ලබන උපරිම වගකීම නියම කිරීමට සෑම අධිකරණයකට අධිකරණ බලය තිබිය යුතු ය.

(3) මේ පනතින් හෝ ඒ යටතේ නැතහොත් වෙනත් යම් ප්‍රඥප්තියකින් හෝ ඒ යටතේ විධිවිධාන කිසිවක් හෝ ප්‍රමාණවත් විධිවිධාන හෝ සලසා නැති, යම් බලයක් ක්‍රියාත්මක කිරීම ඇතුළුව යම් කාරණයක් හෝ ප්‍රශ්නයක් මේ පනත යටතේ පවරන ලද යම් නඩු කටයුත්තක දී උද්ගත වන අවස්ථාවක මේ පනතින් හෝ ඒ යටතේ නැතහොත් වෙනත් යම් ප්‍රඥප්තියකින් හෝ ඒ යටතේ සලසන ලද විධිවිධාන සමග නොගැටෙන හෝ අනනුකූල නොවන ආඥා කිරීමට හෝ විධාන දීමට අධිකරණයට බලය තිබිය යුතු ය.

සිරභාරයට ගැනීමේ බලය.

30. (1) මේ පනත හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග යටතේ වූ වරදක් සිදු කර ඇති යම් තැනැත්තකු අධිකාරිය විසින් විශේෂයෙන් ලිඛිතව බලය දෙන ලද යම් තැනැත්තකු විසින් හෝ පොලිස් නිලධරයකු විසින් වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගනු ලැබ නීතිය අනුව කටයුතු කිරීම සඳහා අවස්ථාවෝචිත පරිදි මහාධිකරණය හෝ කොළඹ දිසා අධිකරණය ඉදිරියට ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් සටතේ වූ වරදක් සිදු කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ වරද සිදු කිරීමේ දී පාවිච්චි කරන ලද යම් භාණ්ඩයක් තහනමට ගනු ලැබිය හැකි අතර, අවස්ථාවෝචිත පරිදි මහාධිකරණය හෝ කොළඹ දිසා අධිකරණය විසින් තීරණය කරනු ලබන යම් ස්ථානයක එය රඳවා ගනු ලැබිය හැකි ය.

31. මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වූ සෑම නඩු පැවරීමක් නීතිපතිවරයා විසින් හෝ ඒ සඳහා නීතිපතිවරයා විසින් ලිඛිතව විශේෂයෙන් බලය දෙන ලද වෙනත් යම් නිලධරයකු විසින් හෝ කරනු ලැබිය යුතු ය. නඩු පැවරිය හැක්කේ කා විසින් ද යන වග.

32. මේ පනත යටතේ අය කරන ලද සියලු දඩ ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය. දඩ ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු බව.

33. මේ පනත යටතේ අධිකාරියට පවරන ලද සියලු බලතල හෝ ඉන් යමක් හෝ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා නමින් හෝ ධුරයෙන් යම් තැනැත්තකු අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව අධිකාරිය විසින් පත් කරනු ලැබිය හැකි ය. අධිකාරිය විසින් බලය පැවරීම

34. (1) නියම කරනු ලැබිය යුතු කරුණු වශයෙන් මේ පනතින් නියමිත කරුණු සහ නියෝග සෑදීමට මේ පනතින් බලය දෙන ලද කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) විශේෂයෙන් ම සහ (1) වන උපවගන්තියෙන් පිරිනමන ලද බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව පහත දැක්වෙන සියලු කාර්ය හෝ ඉන් යම් කාර්යයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය:—

(අ) අධිකාරිය විසින් අවසරපත්‍ර නිකුත් කිරීම පාලනය කරන කොන්දේසි නියම කිරීම;

(ආ) දූෂණය වැළැක්වීම සඳහා නැව්වල සවි කරනු ලැබිය යුතු උපකරණ නියම කිරීම;

(ඇ) ජලයට එකතු කළ විට, ඒ ජලය අපිරිසිදු බවට, අහිතකර බවට, අපවිත්‍ර බවට හෝ යම් තැනැත්තකුගේ සෞඛ්‍යයට, ආරක්ෂාවට හෝ යහ පැවැත්මට හානිකර බවට හෝ සමුද්‍ර ජීවීන්ට හානිදායක බවට පත් කිරීමෙන් ඒ ජලය දූෂණය වීමේ ප්‍රතිඵලය ගෙන දෙන, තෙල් හැර වෙනත් ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍ය පංතියක් හෝ නියම කිරීම.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දින යේ දී හෝ නියෝගයෙහි සඳහන් යම් පසු දිනක ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කිරීමෙන් පසු හැකි ඉක්මණින් පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද සෑම නියෝගයක් ම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. එහෙත් ඒ යටතේ කලින් කරන ලද යම් දෙයකට හානියක් නොවිය යුතු ය.

අධිකාරියට හෝ සේවා නියුක්ත යන්ට විරුද්ධව ඇතැම් අවස්ථා වල දී සිවිල් හෝ අපරාධ නඩු නොපවරනු ලැබිය යුතු බව.

35. (1) මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරනු ලැබුවේ යයි කියනු ලබන යම් ක්‍රියාවකින් සිදු කරන ලද හෝ සිදු විමට ඉඩ ඇති යම් හානියක් සම්බන්ධයෙන් අධිකාරියට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් හෝ නොපවරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරනු ලැබුවේ යයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධිකාරියේ සේවයෙහි නියුක්ත යම් තැනැත්තකුට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් නොපවරනු ලැබිය යුතු ය.

අධිකාරිය සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ බලතල.

36. (1) මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා සාමාන්‍ය හෝ විශේෂ විධාන අමාත්‍යවරයා විසින් ලිඛිතව අධිකාරියට දෙනු ලැබිය හැකි ය. තවද, අධිකාරිය ඒ විධාන ක්‍රියාත්මක කළ යුතු ය.

(2) අධිකාරියේ දේපළ සහ කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන ආකෘතියක් අනුව, වාර වාර්තා, ගිණුම් සහ වෙනත් තොරතුරු තමා වෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කල අධිකාරියට ලිඛිතව විධාන කරනු ලැබිය හැකි ය. තවද, ඒ සෑම විධානයක් ම අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් අධිකාරියේ සියලු කටයුතු හෝ ඉන් යමක් විමර්ශනය කරනු ලැබ වාර්තා කරනු ලැබීමට අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි අතර, ඒ නියමය කරනු ලැබූ විට එය ක්‍රියාත්මක කිරීමට සියලු පහසුකම් අධිකාරිය විසින් සලසනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

37. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"බත්තල" යන්නෙන්, රුවල්වලින් හෝ යාන්ත්‍ර බලයෙන් වූ ස්වයං ධාවනය කිරීමේ ක්‍රම නැත්තා වූ ද ඇදගෙන යා යුතු වූ හෝ උදම් හෝ ප්‍රවාහයේ බලපෑම යටතේ පාවීමට ඉඩ දෙනු ලැබූ බත්තලක් අදහස් වන අතර, ලයිටරයක් හෝ ඒ සමාන යාත්‍රාවක් ඊට ඇතුළත් වේ;

"දැමීම" යන්නෙන්, යම් ද්‍රව්‍යයක් හිතාමතාම ම මුහුදට බැහැර කිරීම අදහස් වන අතර දැමීම, විසිකිරීම, හෙළීම හෝ නැත් පත් කිරීම ඊට ඇතුළත් වේ,

දූෂණ හානියක් සම්බන්ධයෙන් වන විට "සිද්ධිය" යන්නෙන්, හානිය සිදු කරවන්නා වූ යම් සිදුවීමක් හෝ එකම ප්‍රභවයක් ඇති යම් සිදුවීම් පෙළක් අදහස් වේ ;

"සමුද්‍ර විපත" යන්නෙන්, නැව්වල ගැටුමක් හෝ වෙරළේ වැදීමක් හෝ යාත්‍රා කිරීමේ වෙනත් සිද්ධියක් හෝ නැවක හෝ ඉන් බාහිරව ඇති වන වෙනත් සිදුවීමක ප්‍රතිඵලය වශයෙන් නැවකට හෝ නැව්බඩුවලට ද්‍රව්‍යමය හානියක් හෝ ද්‍රව්‍යමය හානියක් වීමේ අත්‍යාසන්න තර්ජනයක් ඇති වෙනත් සිද්ධියක් අදහස් වේ ;

"නෞකාධිපතිවරයා" යන්නට, නියාමකයකු හැර, යම් නැවකට අණදෙන හෝ යම් නැවක් භාරව සිටින සෑම තැනැත්තකු ම ඇතුළත් වේ ;

"පදිංචිකරු" යන්නෙන්, ස්ථානයක හෝ ඉඩමක සැබවින් ම පදිංචිව සිටින තැනැත්තා හෝ එවැනි තැනැත්තකු නැති නම් එහි අයිතිකරු අදහස් වේ ;

"අක්වෙරළේ ඉදිකිරීම" යන්නට—

(අ) ශ්‍රී ලංකා ජලතීරයේ මුහුදු පත්ලෙහි සහ යටි පසෙහි හෝ මුහුදු පත්ල සහ යටි පස මත හෝ මුහුදු පත්ලට සහ යටි පසට ඉහළින් ඉදිකරන ලද, පිහිටුවන ලද, තබන ලද හෝ පාවිච්චි කරන ලද (ස්ථිර වූ හෝ තාවකාලික වූ) යම් ඉදිකිරීමක් හෝ උපකරණයක්.

(ආ) මහාද්වීපික තටකයේ ස්වාභාවික සම්පත් උපයෝජනය කිරීම සම්බන්ධයෙන් එහි මුහුදු පත්ලෙහි සහ යටි පසෙහි හෝ මුහුදු පත්ල මත සහ යටි පස මත හෝ මුහුදු පත්ලට සහ යටි පසට ඉහළින් ඉදිකරන ලද, පිහිටුවන ලද, තබන ලද හෝ පාවිච්චි කරන ලද (ස්ථිර වූ හෝ තාවකාලික වූ හෝ) යම් ඉදිකිරීමක් හෝ උපකරණයක්,

(ඇ) ශ්‍රී ලංකා ජලතීරයේ මුහුදු පත්ලෙහි හෝ වෙරළෙහි හෝ නැංගුරම් ලා තිබෙන හෝ සම්බන්ධ කොට තිබෙන, නැතහොත් මහාද්වීපික තටකයේ ස්වාභාවික සම්පත් ගවේෂණය කිරීම සහ උපයෝජනය කිරීම සම්බන්ධයෙන් මහාද්වීපික තටකයට ඉහළින් වූ ජලය පත්ලෙහි නැංගුරම් ලා තිබෙන (නැවක් නොවන) දිය මත පාවෙන යම් දෙයක්,

(ඈ) යම් විද්‍යාත්මක පර්යේෂණ ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජලතීරයේ හෝ මහාද්වීපික තටකයේ මුහුදු පත්ලෙහි සහ යටි පසෙහි හෝ මුහුදු පත්ලට හෝ යටි පසට ඉහළින් ඉදිකරන ලද, පිහිටුවන ලද, තබන ලද හෝ පාවිච්චි කරන ලද යම් ඉදිකිරීමක් හෝ උපකරණයක්,

(ඉ) අක්වෙරළේ ඉදිකිරීමක්, වෙනත් යම් අක්වෙරළේ ඉදිකිරීමකට සම්බන්ධ කරන්නා වූ යම් ව්‍යුහයක්

ඇතුළත් වේ ;

"තෙල්" යන්නෙන්, කවර වූ හෝ ස්වරූපයකින් වූ කවර වූ හෝ විස්තරයකට අයත් තෙල් අදහස් කෙරෙන අතර, යම් විස්තරයකට අයත් තෙල්වලින් නිපදවන ලද ස්ප්‍රීතු සහ වෙනත් ආස්‍රැත සහ ගල් අඟුරු, තාර, බිටුමන්, බිටුමන් තෛලෝඛ, ඉන්ධන තෙල්, රොන් බොර තෙල් සහ ඉවත දමන ද්‍රව්‍ය සමඟ මිශ්‍ර වූ තෙල් ඊට ඇතුළත් වේ. තව ද ඉවත දමන ද්‍රව්‍ය හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් සමඟ වූ තෙල් මිශ්‍රණ ඊට ඇතුළත් වේ;

"ක්‍රියාකරවන්නා" යන්නට, නැවක් සම්බන්ධයෙන් වන විට, නැව් කුලියට ගනු ලැබුවේ කාලය අනුව වුව ද, යාත්‍රා ගමන අනුව වුව ද පවරා දීමක් මගින් වුව ද නැව කුලියට ගන්නා ඇතුළත් වේ;

"අයිතිකරු" යන්නෙන්, අයිතිකරු වශයෙන් ලියාපදිංචි වූ තැනැත්තා හෝ ලියාපදිංචි කිරීමක් නොමැතිවිට, අයිතිය හෝ සන්තකය ඇති තැනැත්තා අදහස් වේ;

"දූෂක ද්‍රව්‍යය" යන්නෙන්, මේ පනතේ කාර්ය සඳහා දූෂක ද්‍රව්‍යයක් වශයෙන් අමාත්‍යවරයා විසින් නියම කරන ලද යම් ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍ය පන්තියක කොටසක් වන්නා වූ යම් ද්‍රව්‍යයක් අදහස් කෙරෙන අතර, එවැනි යම් ද්‍රව්‍යයකින් අපවිත්‍ර වූ ජලය ඊට ඇතුළත් වේ;

"නියමිත" යන්නෙන්, නියෝග මගින් නියම කරන ලද බව අදහස් වේ;

"නැව" යන්නෙන්, සමුද්‍ර පරිසරයෙහි ක්‍රියාත්මක වන කවර වූ හෝ වර්ගයකට අයත් යාත්‍රාවක් අදහස් කෙරෙන අතර, ධීවර ට්‍රෝලර් යාත්‍රා, ජලරක්තක බෝට්ටු, වාත කොට්ට වාහන, නිමග්න කළ හැකි යාත්‍රා, බත්තල්, පාවෙන යාත්‍රා සහ ධාවන ක්‍රමය හෝ ධාවනය නොමැති වීම කෙරෙහි සැල කිල්ලක් නොමැතිව ස්ථාවර හෝ පාවෙන වේදිකා ඊට ඇතුළත් වේ;

"ශ්‍රී ලංකා ජලතීරය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප පිළිබඳ පනතෙහි අර්ථකථනය කොට ඇති පරිදි පහත දැක්වෙන ජලතීර අදහස් වේ:—

(අ) දේශීය සමුද්‍රය,

(ආ) යාබද කලාපය,

(ඇ) ස්ව සම්පත් කලාපය,

(ඈ) මහාද්වීපික තටකය,

(ඉ) අපවිත්‍ර කිරීම වැළැක්වීමේ කලාපය;

තෙල් හෝ යම් දූෂක ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් වන විට, "මාරු කිරීම" යන්නෙන් තොග වශයෙන් මාරු කිරීම අදහස් වේ.